# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2142/87 - 2019 සැප්තැම්බර් මස 27 වැනි සිකුරාදා - 2019.09.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රේගු නිවේදනයයි**

ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 04/2019

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ආර්. එච්. එස්. සමරතුංග,
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2019 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

***1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත***

*ආඥාව*

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මංගල සමරවීර වන මම, 2019 සැප්තැම්බර් මස 28 වැනි දින සිට, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවේ අනුරූප සටහන් වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ ''අ'' උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවට ද, රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දීය.


1A - PG 4662 — 567 (2019/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| ශීර්ෂ අංකය | සංයෝජිත වර්ගීකරණ සංකේතය | | විස්තරය | තීරුබදු ප්‍රමාණය | | ප්‍රමාණ ඒකකය |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය | සාමාන්‍ය | |
| (1) | (2) | | (3) | (4) | (5) | (6) |
| **22.02** | | | **සීනි හෝ අනෙකුත් පැණිරස කාරක ද්‍රව්‍යයන් එකතු කරනු ලැබුවාවූ හෝ රස කළාවූ, ඛනිජ ජලය හා වායුව කවන ලද (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග හා ශීර්ෂ 20.09 හි සඳහන් පළතුරු හෝ එළවළු යුෂ අඩංගු නොවූ අනෙකුත් අමද්‍යපාන වර්ග** | | | |
| | | | | | | |
| | 2202.99 | -- | අනෙකුත් : | | | |
| | | | | | | |
| | | --- | පළතුරු හෝ එළවළු යුෂ පාදක කරගත් පානයන් : | | | |
| | 2202.99.51 | ---- | මිලි ලිටර 100ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6ට වඩා වැඩි පානයන් | | 30% හෝ ලීටරයට රු. 40/- | ලීටර් |
| | 2202.99.59 | ---- | අනෙකුත් | | 30% හෝ ලීටරයට රු. 35/- | ලීටර් |
| | | | | | | |
| | | --- | අනෙකුත් : | | | |
| | 2202.99.91 | ---- | මිලි ලීටර 100ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6ට වඩා වැඩි පානයන් | | 30% හෝ ලීටරයට රු. 45/- | ලීටර් |
| | 2202.99.99 | ---- | අනෙකුත් | | 30% හෝ ලීටරයට රු. 40/- | ලීටර් |

10 - 534

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.